# ජපානයේ රැකියා සිහිනය සැබෑ කර ගැනීමට ඔබට අනගි අවස්ථාවක්

## මෝටර්රථ කාර්මික නඩත්තු ක්ෂේත්‍රය (Automobile) – (පිරිමි)

IM Japan තාක්ෂණික සේවාස්ථ පුහුණු වැඩසටහන (TITP) යටතේ මෝටර්රථ කාර්මික නඩත්තු ක්ෂේත්‍රයේ - පිරිමි (Automobile -Male) රැකියා සඳහා අයදුම්කරුවන් දැනුවත් කිරීමේ හා බඳවාගැනීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දී පැවැත්වේ.

ඒ සඳහා පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අදාල සහතිකපත් හා ලිපිලේඛන ද සහිතව 2026.07.31 දින පෙ.ව.9.00 ට අංක 234, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය වෙත පැමිණෙන්න.

**(සැ.යු.මීන් පෙර ජපානය සඳහා වීසා අයදුම්කර ප්‍රතික්ෂේප වී ඇති අයදුම්කරුවන් මේ සඳහා අයදුම් කිරීමෙන් වලකින්න)**

**අවශ්‍ය මූලික සුදුසුකම්.**

- වයස අවු.18-30 අතර විය යුතුය.
- ශරීරයේ Tattoos නොතිබිය යුතුය.
- අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිට තිබිය යුතුය. (රජයේ පාසලක හෝ පෞද්ගලික පාසලක වසර 13 ක කාලයක් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබිය යුතුය.)
- වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ කාර්මික විද්‍යාලයකින් මෝටර්රථ ඉංජිනේරු ක්ෂේත්‍රය (Automobile Engineering) පිළිබඳ වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා අදාල පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.
- මෝටර්රථ ඉංජිනේරු ක්ෂේත්‍රය (Automobile Engineering) පිළිබඳ NVQ සහතික ලබා තිබීම සහ ප්‍රායෝගික පුහුණුව සම්පූර්ණ කර තිබීම.
- ජපන් භාෂා N5 ප්‍රවීනතාවය ලබා තිබීම ප්‍රමුඛතාවය හිමිවීමට හේතුවක් වේ.
- උස 160 cm හෝ ඊට වැඩිවිය යුතුය.
- බර 50 Kg හෝ ඊට වැඩිවිය යුතුය.
- දෘෂ්ඨි ආබාධ නොතිබිය යුතුය. (ජපන් දෘෂ්ඨි අගය 0.7 ට වඩා වැඩි හා ශ්‍රී ලංකා දෘෂ්ඨි අගය 6/9 වඩා වැඩි)

**අවශ්‍ය ලිපිලේඛන.**

- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (අයදුම්පත්‍රය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ www.slbfe.lk වෙබ් අඩවියේ පලකර ඇත)
- පාසැල් හැරයාමේ සහතිකය
- අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල සහතිකය
- ජාතික හැඳුනුම්පත
- මෝටර්රථ ඉංජිනේරු ක්ෂේත්‍රය (Automobile Engineering) පිළිබඳ NVQ සහතික, වෘත්තීය සහතික සහ සේවා සහතික

**වැඩි විස්තර සඳහා 1989 අමතන්න**

**(බඳවාගැනීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් පමණි.)**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**